රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

அரசாங்க நிருவாகச் சுற்றறிக்கை

PUBLIC ADMINISTRATION CIRCULAR

අංක
இல.
No. } 19

# රජයේ සේවකයන්ට දේශපාලන අයිතිවාසිකම් දීම

261 වැනි පාලන රෙගුලාසිය සංශෝධනය කිරීම

# அரசாங்க சேவையாளர்க்கு அரசியல் உரிமைகள்

261 ஆம் நிருவாக ஒழுங்குவிதிக்குத் திருத்தம்

# POLITICAL RIGHTS FOR PUBLIC SERVANTS

Amendment to Administrative Regulation 261

ආයතන මාලා අංක
தாபனத் தொடர் இல.
Establishment Series } 11
2/9/170 (৩০)

මිළ/விலை/Price : -/20 තැපැල් ගාස්තුව/தபாற் செலவு/Postage : -/10

# රජයේ සේවකයන්ට දේශපාලන අයිතිවාසිකම් දීම

## 261 වැනි පාලන රෙගුලාසිය සංශෝධනය කිරීම

අංක 14 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි සඳහන් 261 වැනි අළුත් පාලන රෙගුලාසිය පහත දැක්වෙන පරිදි කියැවෙන සේ මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" 261. පහත දක්වන වර්ගවල නිලධාරීන්ට හැර, අන්‍ය සියලුම රජයේ නිලධාරීන්ට, 262 වැනි පරිපාලන රෙගුලාසියෙහි විස්තර කෙරෙන පරිදි, සම්පූර්ණ දේශපාලන අයිතිවාසිකම් හිමිවෙයි —

(i) අධිකරණ නිලධාරීහු ;


(ii) සන්නද්ධ යුද්ධ හමුදුවල සේවකයෝ ;

(iii) පොලිස් හමුදවේ සේවකයෝ සහ අපරාධ නඩු සංවිධාන සංග්‍රහය යටතේ පොලිස් කටයුතු ඉටු කරන වෙනත් සාම නිලධාරීහු (උද. ග්‍රාම සේවකයෝ) ;

(iv) බන්ධනාගාර නිලධාරීහු—(138 වැනි අධිකාරය වන) වෘත්තීය සමිති පනතේ 20 වැනි වගන්තියෙහි විස්තර කර තිබෙන පරිදිය සහ ;

(v) රජයේ සේවයේ නියුක්ත සියලුම මාණ්ඩලික නිලධාරීහු සහ අධීක්ෂණ නිලධාරීහු. මේ සඳහා " මාණ්ඩලික " හෝ " අධීක්ෂණ " නිලධාරියා යනුවෙන් අදහස් කෙරෙනුයේ වර්ෂයකට රුපියල් 6,720 කින් හෝ ඊට වැඩි ගණනකින් පටන් ගන්නා (ඒකාබද්ධ) වැටුප් ක්‍රමයක් ඇති රජයේ සේවකයෙකි. "

(අ. ක.) බී. මහාදේව,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.



රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල්.

1970 දෙසැම්බර් 16 වැනි දින,
කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේ දී ය.
තැ. පෙ. අංක. 1699.